# කොරියානු රටෙහි සේවය නිම කොට පැමිණි ශ්‍රී ලාංකිකයන් සඳහා මෙම වසරේදී පවත්වනු ලබන සුහද හමුව අගෝස්තු 17 වනදා බත්තරමුල්ල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දී....

කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ දකුණු කොරියාවෙහි සේවය නිමකර පැමිණි ශ්‍රී ලාංකිකයන් උදෙසා වසරක් පාසා පවත්වනු ලබන සුහද හමුව මෙවරත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ඒකාබද්ධව පැවැත්වීමට කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයේ (HRD) ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය විසින් කටයුතු යොදා ඇත.

කොරියාවේ සිය සේවා කාලය නියමිත පරිදි නිමකර නීත්‍යානුකූල ලෙස පැමිණි සියලුම ශ්‍රී ලාංකිකයන්ට මේ සඳහා සහභාගී වීමට ආරාධනා කෙරෙන අතර ඔබගේ සහභාගීත්වය **2017.08.11** දින ප.ව **03.00** ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය වෙත **0113 108045/ 0113 108051** හෝ **0112-886945** යන දුරකතන ඔස්සේ තහවුරු කිරීම අනිවාර්ය වේ.

මෙම හමුවේදී ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානයේ කොරියානු අධ්‍යක්ෂකතුමා ඔබ අමතනු ඇති අතර කොරියාවෙහි සිට මෙරටට පැමිණි ඔබගේ අභිවෘද්ධිය සඳහා කල හැකි වැඩසටහන් පිළිබඳව, රැකියා හා ආයෝජන අවස්ථා මෙන්ම ඊට අදාල උපදේශනයන්ද ලබාගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත. තවද ශ්‍රී ලංකාවේ සිටින කොරියානු සේවා යෝජකයන්ද මේ සඳහා සහභාගි කර ගැනීමට සැලසුම් කර ඇත. මීට අමතරව ඉදිරි වැඩසටහන් පිළිබඳව අදහස් හා යෝජනා ලබාගනු ලබන අතර ඒ සඳහා ඔබගේ දායකත්වය හා සහභාගීත්වය අපේක්ෂා කරන්නෙමු.

දිනය : **2017.08.17**
වේලාව : පෙ.ව **09.30**
ස්ථානය : ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ශ්‍රවණාගාරය,
නො. **234**, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

**කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය,**
**නො: 171/4, දෙවන මහල, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල**